ශීර්ෂ 315 - උතුරු පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2018 වර්ෂය

1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

1.1 දැක්ම

උතුරේ ජනතාවගේ අපේක්ෂාවන් තෘප්තිමත් කිරීම උදෙසා යහපාලනය ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම මගින් ධරණීය සංවර්ධනය සහිතව සමෘද්ධිමත් බව ලඟාකර ගැනීමට අරමුණු කර ගැනීම.

1.2 මෙහෙවර

ජීවනෝපාය නැවත පිහිටුවීම මඟින් සේවා හා යටිතල පහසුකම් නැවත සක්‍රීය කිරීම සමඟ උතුරු පළාතේ ජනතාව ඉලක්ක කර ගනිමින් යටිතල පහසුකම් පුනරුත්ථාපනය හා මානව සම්පත් සංවර්ධනය

1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම

2. විසර්ජන ගිණුම

මුළු ප්‍රතිපාදන හා ගිණුම

උතුරු පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 28,289.64 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 25,572.48 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 2,717.16 ක් හෙවත් සියයට 9.60 ක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2018 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 23,323.51 | 22,109.48 | 1,214.03 | 5.21 |
| මූලධන | 4,966.13 | 3,463.00 | 1,503.13 | 30.27 |
| එකතුව | 28,289.64 | 25,572.48 | 2,717.16 | 9.60 |

3. විගණන නිරීක්ෂන

පාර්ලිමේන්තුව විසින් ඉහත ශීර්ෂය යටතේ ලබාදුන් ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ ගිණුම්ගත කරන ලද අතර ඒ අනුව උපයෝජනය කරන ලදි. පළාත් සභා අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරණු ලැබේ.